මුසලි ප්‍රාදේශීය සභාව

මන්නාරම දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
   -----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 වන දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 වන දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජුලි 18 වන දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මුසලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 වැනි දිනැති අංක පීඑල්එස්/05/පීඒ/එස්එෆ්පීඑස්එස් දරන ලිපිය ප්‍රකාරව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්‍ෂණය විය.

(අ) ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2015 වර්ෂයට අදාළව මස් කඩ වලින් අයවිය යුතු ගාස්තු රු.1,074,883 ක් ලෙස පෙන්වා ඇති නමුත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එය රු.981,279 ක් ලෙස පෙන්වා තිබුණි. ඒ අනුව ජංගම වත්කම් රු.93,604 කින් වැඩිපුර පෙන්වා තිබුණි.

(ආ) මුසලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති දුරකථන සම්ප්‍රේශණ කුළුණු 10 කින් අයවිය යුතු ආදායම් රු.125,000 ක් ලෙසද හඳුනාගෙන ඇති නමුත් ශේෂ පත්‍රයෙහි ලැබිය යුතු ආදායම් ලෙස රු.125,000 ක් නොපෙන්වීමෙන් ජංගම වත්කම් රු.125,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත පරිදි අනාවරණය විය.

| නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ සඳහා යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | |
| (i) රීති අංක 5(xii) | මූල්‍ය හා ගබඩා ගණුදෙනු පිළිබඳ වගකිව යුතු නිලධාරීන් වෙත ප්‍රමාණවත් ඇපකර ලබාගෙන නොතිබුණි. |
| (ii) රීති අංක 59 | සෑම වර්ෂයක් ආරම්භයේදී ආදායම් පරීක්ෂක හෝ ආදායම් පරිපාලක හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත පිළිබඳ පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (iii) රීති අංක 178(3) | කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (iv) රීති අංක 218 | සභාවේ සභාපති හෝ බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ සෑම වර්ෂයකටම වරක් සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පරීක්ෂාවක් මෙම වාර්තාවේ දිනය දක්වා සිදු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 | 2016 මැයි 16 දින සිදුකරන ලද භෞතික මුදල් පරීක්ෂාවේදී සභාවේ මුදල් අයකැමි ඇතැතිව තිබිය යුතු මුදල් ප්‍රමාණය රු.12,920 කින් අඩුවිය. මේ සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුමට අදාළ නිලධාරියාගෙන් මුදල් අයකරගෙන ඇති අතර එම නිලධාරියා සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා ගත් ක්‍රියාමාර්ග 2017 මැයි 23 දින දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.<br>2016 ජුලි 15 දිනැති විගණන විමසුම මඟින් අවස්ථා 05 කට අදාළව රු.8,750 ක් වටිනා එකතු කළ ආදායම් නියමිත දිනවල බැංකුගත කර නොතිබුණු බව පෙන්වා දී තිබූ අතර මේ සම්බන්ධයෙන් 2017 මැයි 23 දක්වා එම නිලධාරියා සම්බන්ධයෙන් ගත් පියවරයන් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.<br>සභාව සතු සිලාවතුරෙයි කඩ සාප්පුවල එක් කඩ සාප්පුවක් කිසිඳු ගිවිසුමකින් තොරව මාස 09 කට අධික අදාළ කාල සීමාවක් පදිංචිව සිටි ඇති නමුත් සභාවේ ආදායම් රැස්කරන නිලධාරියා විසින් එම පුද්ගලයාගෙන් බදු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.මේ සම්බන්ධයෙන් යොමු |

| | | | |
|---|---|---|---|
| | | | කළ විගණන විමසුමට අදාළ බදු අයකර ගෙන තිබූ අතර නියමිත පරිදි බදු අය නොකළ නිලධාරියා සම්බන්ධයෙන් ගත් පියවරයන් 2017 මැයි 23 දින දක්වා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 371 | 1998 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විවිධ වූ සේවා සැපයීමට අදාළව සභාවේ නිලධාරීන්ගෙන් හා බාහිර පුද්ගලයින්ගෙන් අයවිය යුතු අත්තිකාරම් මුදල වූ රු.402,249 ක් අද වන තුරු නිරවුල් කර නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 571 | රු.2,620,367 ක් වටිනා දිගු කාලයක සිට පැවත එන පොදු තැන්පතු, ගිණුම්වල ශේෂව පවතින බව පෙන්වා ඇති නමුත් එම තැන්පතු රාජ්‍ය ආදායමට ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) | අංක IAI/2002/02 දරන හා 2002.11.28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ | | පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,738,377 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,035,482 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතඵලය රු.297,105 කින් පහත බැස තිබූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රදාන ලැබීම් අඩු වීම හා සභාවේ ආදායම අඩුවීම ඊට හේතු වී තිබුණි.

2.2 ආදායම් කළමනාකරණය

----------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ ප්‍රතිඵලය

-------------------------------

සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අයවැයගත ආදායම, තත්‍ය ආදායම පිළිබඳ සැලකිය යුතු වෙනස්කම් පහත පරිදි විය.

| ආදායම් විස්තරය | අයවැයගත ආදායම | තත්‍ය ආදායම | හිඟ ආදායම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| බදු කුලිය | 3,130,000 | 3,242,928 | 112,928 | 4 |
| බලපත්‍ර ගාස්තු | 360,000 | 404,921 | 44,921 | 12 |
| සේවා ගාස්තු | 3,075,000 | 2,080,075 | (994,925) | (32) |
| වරෙන්තු ගාස්තු | 600,000 | 2,169,850 | 1,569,850 | 262 |

| | | | | |
|---|---|---|---|---|
| දඩ මුදල් හා අධිභාර | | | | |
| අනෙකුත් ආදායම් | 112,500 | 466,089 | 353,589 | 314 |
| රජය ප්‍රදාන | 26,535,715 | 22,437,106 | (4,098,609) | (15) |
| | --------------- | -------------- | ---------------- | |
| එකතුව | 33,813,215 | 30,800,969 | (3,012,246) | |
| | ======== | ======= | ======== | |

2.2.2 බදු කුලී

---------

(අ) අරිප්පු දකුණ යන ප්‍රදේශයෙහි ජීවත්වන පුද්ගලයකුගෙන් අයවිය යුතු රු.78,000 ක් වටිනා වාහන බදු කුලී ශේෂයක් පෙන්නුම් කළ අතර එම මුදල අයකර ගැනීමට හෝ එළඹි ගිවිසුමෙහි 12 වැනි වගන්තිය ප්‍රකාරව නඩු පැවරීමට හෝ සභාව විසින් කිසිදු පියවරක් 2017 මැයි 20 දින දක්වා සිදුකර නොතිබුණි.

(ආ) අරිප්පු ප්‍රදේශයෙහි ජීවත්වන තවත් පුද්ගලයකුගෙන් අයවිය යුතු රු.76,000 ක් වටිනා වාහන බදු කුලී ශේෂයක් පෙන්නුම් කළ අතර එම මුදල අයකර ගැනීමට හෝ එළඹි ගිවිසුමෙහි 12 වැනි වගන්තිය ප්‍රකාරව නඩු පැවරීමට හෝ සභාව විසින් කිසිදු පියවරක් 2017 මැයි 20 දින දක්වා සිදුකර නොතිබුණි.

(ඇ) මස් කඩ වෙනුවෙන් වූ කල්බදු ගාස්තු 2015 වර්ෂයේ සිට හිඟව පවතින අතර එම කල්බදු ගාස්තු කල්බදුහිමියාගෙන් අයකර ගැනීමට හෝ අවශ්‍ය නීතිමය පියවර ගැනීමට හෝ 2017 මැයි 20 දින දක්වා සභාව විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

2.2.3 අනෙකුත් ආදායම්

------------------

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විවිධ වූ සමාගම් මඟින් ස්ථාපිත කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 10 ක් දැකිය හැකි අතර ඉන් සමාගම් දෙදකට අදාළව දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 05 සම්බන්ධයෙන් වර්ෂ 2010 සිට වර්ෂ 2016 දක්වා කාලය තුළ වාර්ෂික බදු කුලී ගාස්තු රු.125,000 ක් ගෙවිය යුතු ලෙස ශේෂව පැවතුණි.

(ආ) මුසලි ප්‍රාදේශීය සභාවේ පුද්ගලයන් 96 කින් හා නිවාස ව්‍යාපෘති 59 ක ජනතාව වෙත පානීය ජලය ලබාදීමට අදාළව රු.103,500 ක් වටිනා ගාස්තු විගණන දිනය තෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්‍ෂණය විය.

(ඇ) ජලය සැපයීමට අදාළව වගකිව යුතු නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් සභාව වෙත රු.128,400 ක පාඩුවක් සිදුවී තිබු අතර මෙම මුදල විගණන දිනය වන තෙක් අය කර ගැනීමට අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

----------------

පළාත් පාලන දෙපාර්තමේන්තු වෙතින් වර්ෂ 2010 සිට වර්ෂ 2014 දක්වා කාලය තුළ අයවිය යුතු රු.4,430,455 ක් වටිනා මුද්දර ගාස්තු ලබා ගැනීමට සභාව විසින් කිසිදු පියවරයක් ගෙන නොතිබුණි.

2.2.5 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

ප්‍රාදේශීය සභාව වෙත නිම කිරීම සඳහා ලබාදෙන ලද මාර්ගයක ඇස්තමේන්තුගත දිග මීටර් 130 ක් වූ අතර සභාව විසින් සත්‍ය ලෙස ඉටුකරන ලද මාර්ගයේ දිග මීටර් 124 ක් විය. මේ හේතුවෙන් මෙම මාර්ග තැනීම සඳහා ලබාදුන් රු.249,645 ක් වටිනා මුදල සම්පූර්ණ ලෙස භාවිත නොකර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

3.1 වත්කම් කළමනාකරණය

------------------------------

(අ) වර්ග 4 කට අදාළ වත්කම් වර්ෂ 3 සිට වර්ෂ 6 දක්වා කාලය තුළ නිෂ්කාර්යව පැවති අතර මෙම වත්කම් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ නියමිත ක්‍රියා පිළිවෙතකට අනුව විකිණීමට හෝ අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) පුරනැගුම ව්‍යාපෘතිය මඟින් 2013 වර්ෂයේදී ඉදිකරන ලද රු.මිලියන 15.1 ක් වටිනා කඩ සාප්පු සංකීර්ණ දෙකක් මුළුමනින්ම අද දක්වා භාවිතා නොකර වසා දමා තිබුණි.

(ඇ) උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් වර්ෂිකව නිකුත් කරන ලද රථවාහන රීති චක්‍රලේඛයෙහි 203 පරිච්ඡේදයෙහි 37 වන වගන්තිය අනුව යම් වාහනයක් මාස 6 කට වඩා වැඩි කාලයක් භාවිතයට ගැනීමට නොහැකි වන්නේ යැයි අදහස් කරන්නේ නම් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් මො.ආ 107 පත්‍රිකාව සමඟ මුදල් කුවිතාන්සි පත්‍රයක් නියමිත ආයතන වෙත යැවීමෙන් බදු නිදහක් ලබා ගත හැකි බව දන්වා තිබුණි. එසේවුවද, එම චක්‍රලේඛයට පටහැනිව මුසලි ප්‍රාදේශීය සභාව විසින් දිගු කාලයක සිට භාවිතයට නොගත් වාහන 18 ක් සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී රු.12,850 ක් වටිනා ආදායම් බදු හා රු.16,325 ක් දඩ මුදල් ද බදු නිදහස් කිරීමක් ලබා ගැනීමෙන් තොරව ගෙවා තිබුණි.

(ඈ) විගණනය වෙත සපයන ලද තොරතුරු අනුව භාවිතයට ගත හැකි වාහනයක් වෙනුවෙන් වාහන විෂයභාර නිලධාරියාගේ හා රියදුරාගේ නොසැලකිල්ල හේතුවෙන් 2017 වර්ෂයේදී වාර්ෂික බලපත්‍ර ගාස්තු සඳහා රු.8,650 ක දඩ මුදලක්ද සමඟ ගෙවා තිබුණි.

4. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

-------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

(අ) අවසන් මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ශේෂ පිරික්සුමෙහි හා ලාභ ගිණුමෙහි " රුපියල්" ලෙස සඳහන් කර නොතිබුණි.

4.2 අයවැය පාලනය

------------------

(අ) ප්‍රවර්ථන වර්ෂයේදී අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කරන ලද වැය විෂයයන් 26 කට අදාළව එකතුව රු.6,632,600 ක් වටිනා ප්‍රතිපාදනයන් සියයට 40 සිට සියයට 100 දක්වා භාවිතා කර නොතිබුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂයේදී අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කරන ලද වැය විෂයයන් 09 කට අදාළව එකතුව රු.2,145,255 ක් වටිනා ප්‍රතිපාදන සියයට 100 ක්ම භාවිතා නොකර ඉතිරි කර තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම

(ආ) අයවැය පාලනය

(ඇ) ලැබිය යුතු ගිණුම්

(ඈ) ස්ථාවර තැන්පතු

(ඉ) ගිණුම්කරණය